# කණ්ඨක චෛත්‍යය පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත සංචාරක ස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීම පිළිබඳ සිද්ධි අධ්‍යයනයක්

*කුමාර ජේ.ඒ.එස්.එන් [1] අබේකෝන් ඒ.එම්.වී.පී.ඩබ්ලිව් [2]*

ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිහින්තලා ඓතිහාසික පුදබිම තුළ පිහිටා ඇති කණ්ඨක චෛත්‍යය ආගමික මෙන්ම පුරාවිද්‍යාත්මක වශයෙන් ද සුවිශේෂි ස්ථානයකි. එනමුත් තවමත් කණ්ඨක චෛත්‍යය ජනප්‍රිය සංචාරක ස්ථානයක් බවට පත් වී නැත. ඒ අනුව මෙම අධ්‍යනයේ ප්‍රධාන අරමුණ වන්නේ කණ්ඨක චෛත්‍යයෙහි පුරාවිද්‍යාත්මක වටිනාකම සුරැකෙන පරිදි ඉහළ සංචාරක ආකර්ශනීය ස්ථානයක් බවට පත් කරන්නේ කෙසෙදැයි අධ්‍යයනය කිරීමයි. පර්යේෂණයට අදාළ ප්‍රාථමික දත්ත මිහින්තලේ පුදබිම තුළ සංචාරය කරමින් කණ්ඨක චෛත්‍යය පිළිබදව සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමවේදය, ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා මගින් රැස්කර ගැනිණි. පොත්, සඟරා, පර්යේෂණ  පත්‍රිකා සහ අන්තර්ජාලය යන ද්විතීයික මූලාශ්‍ර මගින් ද අදාළ දත්ත රැස්කර ගැනිණි. පර්යේෂණයේ ප්‍රතිඵල අනුව මිහින්තලා රජමහා විහාරය, මිහිඳු මහා සෑය, ආරාධනාගල සහ කලුදිය පොකුණ වැනි ස්ථාන වෙත සංචාරක ආකර්ශනය ඉහළ බවත් කණ්ඨක චෛත්‍යයට අඩු බවත් එය හුදෙකලාව පිහිටා තිබීම ද ඊට හේතු වී ඇති බවත් ගම්‍ය විය. එසේම චෛත්‍යය අවට ඇති කැටයම්, සිතුවම් තුළ දේශීය තාක්ෂණය, ආගමික විශ්වාස යනාදිය තිබුණත් මේ දක්වා ඒවාට කිසිදු ආවරණයක් නොමැති හෙයින් වටිනා සාක්ෂි විනාශ වී යාමේ අභියෝගයකට මුහුණ පා ඇති බව පැහැදිලි විය. එමෙන්ම සංචාරක මගපෙන්වන්නන් විසින් සංචාරකයින්ට අසත්‍ය තොරතුරු ප්‍රචාරණය මෙයට සංචාරකයින් ළඟා නොවීමට හේතු වී ඇති බවත් අවබෝධ විය. පර්යේෂණයේ නිගමන අනුව පැහැදිලි වන්නේ පරිසර හිතකාමි ලෙස කණ්ඨක චෛත්‍යය සංචාරක ආකර්ෂණීය ස්ථානයක් බවට ප්‍රවර්ධනය කිරීම උචිත බවයි. එබැවින් කණ්ඨක චෛත්‍යයට ප්‍රවේශ විය හැකි ආකාරය දැක්වෙන නාම පුවරු ප්‍රදර්ශනය, අවට සංචාරක පැකේජ නිර්මාණයේ දී කණ්ඨක චෛත්‍යය ඇතුළත් කිරීමට සංචාරක නියෝජිත ආයතන දිරිගැන්වීම, කණ්ඨක චෛත්‍යය පිළිබඳ තොරතුරු සඳහන් වීඩියෝ සහ පත්‍රිකා සංචාරකයින් බහුලව ගැවසෙන හෝටල් සහ සංචාරක උණුසුම් ස්ථානවල ප්‍රදර්ශනය, සංචාරක මගපෙන්වන්නන්ට කණ්ඨක චෛත්‍යය පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබාදීම වැදගත් වේ. කණ්ඨක චෛත්‍යයට ප්‍රවේශ වීමේදී සංචාරකයන්ට රිලවුන්ගෙන් සහ වඳුරන්ගෙන් සිදුවන හානි වැළැක්වීමට ඔවුන්ගේ ගමන් මලු තැබීමට ආරක්ෂක කුටියක් ඊට ප්‍රවේශ වන ස්ථානයේ ඉදිකළ හැකිය. එමෙන්ම කණ්ඨක චෛත්‍යය අවට කැළිකසල ක්‍රමවත්ව බැහැරලීමට ක්‍රියාමාර්ග ගැනීමත් එහි පොලිතින්, ප්ලාස්ටික් භාවිතය තහනම් කිරීමත් සිදුකළ හැකිය. මීට අමතරව සංචාරකයන්ට පිරිසිදු පානිය ජල සැපයුමක් ලබාදීමට යකඩ වැටකින් යුතු පින්තාලියක් සකස් කළ හැකිය. එමගින් වන සතුන්ගෙන් එල්ල වන බලපෑම් අවම වීමටත් ප්ලාස්ටික් වතුර බෝතල් භාවිතය අවම කිරීමටත් රුකුලක් වනු ඇත. ඒ අනුව ශ්‍රී ලාංකේය සංස්කෘතිය ලොවට කියාපාන කැඩපත් බඳු මෙවන් ස්ථාන සංචාරක ආකර්ෂණීය ස්ථාන ලෙස ප්‍රවර්ධනය කිරීම යුගයේ කාලීන අවශ්‍යතාවයක් බව මෙම අධ්‍යයනයෙන් තහවුරු විය.

**මුඛය පද** - *පුරාවිද්‍යාත්මක, සංචාරක ස්ථාන, කණ්ඨක චෛත්‍යය, සංචාරක ආකර්ෂණය, පරිසර හිතකාමී*

[1] සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේssh2020005@ssh.rjt.ac.lk

[2] සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ ssh2020005@ssh.rjt.ac.lk